EN/04/ September-October 2026

# BELIEVERS EASTERN CHURCH

World Headquarters, St Thomas Community
Thiruvalla - 689 103, Kerala, India

# SHEPHERD’S LETTER

2026 සැප්තැම්බර්-ඔක්තෝම්බර්

**මාගේ ආදරණීය එඬේරුන් සහ ශුද්ධ වූ සභාවේ සියලුම විශ්වාසකයිනි,**

**අපගේ ස්වාමීන් සහ ගැළවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ අනුග්‍රහයත්, කරුණාවත්, සාමයත් ඔබ සමග වේවා!**

ශුද්ධ වූ සභාවේ තවත් ජනවන්දනා වර්ෂයක අවසානය කරා ළඟා වෙමින් සිටින විටදී, මොහොතක් නතර වී ඒ පිළිබඳව මෙනෙහි කිරීමට අපට ශුද්ධ වූ අවස්ථාවක් උදා වී තිබේ. අපගේ සභාවේ සෑම මීසමකම මෙන්ම සෑම විශ්වාසිකයෙකුගේම පොදු ජීවිතයේ වැදගත් අංශයක් වෙනුවෙන් නැවත කැපවන ලෙස මම ඔබට ආරාධනා කරමි; එනම් සෑම මීසමක්ම සුරක්ෂිත හා ශුද්ධ වූ ස්ථානයක් බවට පත් කිරීමයි.

## සභාව රෝහලක් වැනිය

ශුද්ධ වූ පියවරුන් බොහෝ විට සභාව රෝහලකට සමාන කොට විස්තර කරනු ලැබීය. එහිදී තුවාල ලැබූ සහ සිදීගිය ආත්මයන්, ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයාණන් වෙතින් කරුණාව සහ සුවය ලබා ගැනීමට පැමිණෙයි. අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගැන කතා කිරීමේදී මෙය ඉතා අලංකාර ලෙස ප්‍රකාශ වේ; "ඔහු යුක්තිය ජයට පමුණුවන තුරු තැළුණු බට දණ්ඩක් බිඳින්නේ නැත; දුම් නඟින පහන් තිරයක් නිවන්නේ නැත. (ශුද්ධවර මතෙව් 12:20) තැළුණු බට දණ්ඩ සහ දුම් දමන පහන් තිරයෙන් නිරූපනය වන්නේ ශක්තිය පිරිහෙමින් පවතින, බලාපොරොත්තුව වියැකී යමින් පවතින සහ පාපය, දුක් වේදනා හෝ විවිධ කරදර හේතුවෙන් ජීවිතය තුවාල වී ඇති අයයි. එහෙත් ක්‍රිස්තුන් වහන්සේ ඔවුන්ව ඉවත නොදමයි, උන් වහන්සේ ඔවුන්ව මෘදුව නැවත යථා තත්ත්වයට පත් කරයි, ශක්තිමත් කරයි, අලුත් කරයි. ඔවුන් සභාවට පැමිණෙන විට, පසුතැවිලි වී යාච්ඤා කර සුවය ලබා ගන්නා අතර, දෙවියන් වහන්සේගේ ජීවමාන වචනයෙන් පිරිසිදු වී, දිව්‍ය සත්ප්‍රසාදයට පංගුකාරීත්වය දරමින් ද ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය තුළ එකට ජීවිතය අත්විඳිති.

## සභාව සුරක්ෂිත ස්ථානයකි.

අපි කිසිවෙකු සභාවට පැමිණෙන්නේ අප දැනටමත් පරිපූර්ණත්වයට පත්වී සිටින නිසා නොවේ. ඒ වෙනුවට, අපගේ ස්වාමීන් වහන්සේම මෙසේ වදාළ සේක: "රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදෙකුගෙන් වැඩක් නැත." (ශුද්ධවර මතෙව් 9:12)

මේ හේතුව නිසා, අපගේ සභාවේ සෑම දරුවෙකුටම, සෑම තරුණයෙකුටම, අවදානමකට ලක්විය හැකි සෑම පුද්ගලයෙකුටම සහ අපගේ සභාවේ ප්‍රජාවේ සෑම සාමාජිකයෙකුටම ගෞරවයෙන් සැලකීමට  සහ විපතින් ආරක්ෂා කිරීම සහතික කිරීමට, අපගේ සභාව කැපවී සිටියි. සුරක්ෂිත සභාවක් යනු හුදෙක් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පමණක් ඇති තැනක් නොවේ. එය ක්‍රිස්තියානි ප්‍රේමය, ගෞරවය, අවංකභාවය, වගවීම සහ එකිනෙකා කෙරෙහි ඇති සැබෑ රැකවරණය යන ගුණාංග සැමදෙනා විසින්ම ක්‍රියාවට නංවන ප්‍රජාවකි. අපගේ මීසම් ප්‍රජාව වෙත ඇතුළු වෙන සියලු දෙනාම, ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය වන ඔබ සහ මා තුළින් - එනම්, උන් වහන්සේගේ ජනතාව තුළින් - ක්‍රිස්තුන් වහන්සේගේ දයානුකම්පිත වැළඳගැනීම අත්විඳිය යුතුය.

## සුභාරංචිය ප්‍රකාශ කිරීමේ අපගේ වගකීම.

එබැවින්, ආරක්ෂාව සැලසීම යනු හුදෙක් පරිපාලනමය වගකීමක් හෝ ආයතනික අවශ්‍යතාවයක් නොවේ. එය දුර්වලයන් කෙරෙහි ඉවසීම ඇති, පව්කාරයන් කෙරෙහි කරුණාවන්ත වූ සහ උන්වහන්සේගෙන් රැකවරණය පතන සියල්ලන්ට දයාව දක්වන දෙවියන් වහන්සේගේ චරිතය තුළ මුල් බැසගත් සුභාරංචි බැඳීමකි.

මෙම කැපවීම සඳහා සභා ජීවිතය තුළ ක්‍රිස්තුන් වහන්සේව මූලික කරගත් චර්යාධර්ම පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා අපගේ කැපවීම නැවත අලුත් කරගැනීමද අවශ්‍යවේ. සෑම බිෂොප්වරයෙකුම, පූජකවරයෙකුම, ඩීකන්වරයෙකුම, එවැන්ජලිස්තවරයෙකුම, සේවා කණ්ඩායම් නායකයෙකුම, ස්වේච්ඡා සේවකයෙකුම සහ විශ්වාසවන්ත සාමාජිකයෙකුම අපගේ වචන, ක්‍රියා සහ සබඳතා තුළින් ක්‍රිස්තුන් වහන්සේගේ චරිතය පිළිඹිබු කිරීමේ වගකීම දරනු ඇත.

අප බලය පාවිච්චි කරන ආකාරය, එකිනෙකා රැකබලා ගන්නා ආකාරය සහ හැසිරෙන ආකාරය සෑම විටම අප සේවය කරන ස්වාමීන් වහන්සේට ගෞරවයක් විය යුතුය.

## පසුතැවිලි වීමට සහ නැවත කැපවීමට කැඳවීම

ශුද්ධ ලියවිල්ල අපට මතක් කර දෙන්නේ අලුත් වීම ආරම්භ වන්නේ පසුතැවිලි වීම තුළින් බවයි. ගීතිකාකරු මෙසේ යාච්ඤා කරයි: "දෙවිඳුනි, මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව; තිරසර නව ආධ්‍යාත්මයක් මට දුන මැනව." (ගීතාවලිය 51:10) නමස්කාරය, යාච්ඤාව, උපවාසය සහ විශ්වාසවන්ත ජීවන ගමනකින් යුත් නව වසරකට ඇතුළු වීමට පෙර, අපි එකිනෙකා මදක් නැවතී අපගෙන්ම මෙසේ අසා ගැනීමට කාලය ගනිමු: අපගේ මීසම් ප්‍රජාව සැබවින්ම දෙවියන් වහන්සේගේ සදාකාලික මූලධර්ම සහ ජීවන රටාවේ ජීවමාන සාක්ෂිකරුවන්ද?

අපගේ ජීවිත වල ශුද්ධකමට, සේවයේ විශ්වාසවන්තභාවයට සහ අපගේ භාරකාරත්වයට පවරා ඇති අයගේ ආරක්ෂාව උදෙසා අප සහ අපගේ මීසම් ප්‍රජාව නැවත කැපකරමු. මෙය අපව කිසිදු අලුත් දෙයක් වෙත නොව, අපගේ මූලික හා පදනම්ගත මූලයන් වෙත නැවත කැඳවීමකි. අප වෙත පවරා ඇති සියලු සම්පත්වලින් - එනම් නව වසරේ ශුද්ධ ලියවිලි දර්ශකය, ජනවන්දනා දින දර්ශනය, මංගල්‍යයන්, උපවාස හා උත්සව, දන්දීම් සහ හිතාමතා තෝරාගත් සරල ජීවන රටාව යන මේ සියල්ලෙන් අපි උපරිම ප්‍රයෝජන ගනිමු. පුද්ගලයන් ලෙස සහ ක්‍රිස්තුන් වහන්සේ තුළ මීසම් ප්‍රජාවක් ලෙස, අවබෝධය, විචාර බුද්ධිය, දයාව සහ විනිශ්චය කිරීම වෙනුවට

අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී කරුණාව සහ දයාව පෙන්වීමට සූදානමින් සිටීම යන ගුණාංගය ඔස්සේ අපි වර්ධනය වෙමු. මෙම මූලයන් නිරන්තරයෙන් අලුත් කර ගැනීම සහ ගැඹුරු කිරීම තුළින්, ක්‍රිස්තියානි ජීවිතයේ තිරසාරභාවය, දීර්ඝායුෂ සහ කල් පවතින ඵලදායිතාව අපි තහවුරු කර ගනිමු. තවදුරටත් මීසම් ප්‍රජාවන් සියල්ලම ක්‍රිස්තුන් වහන්සේගේ පැවැත්ම අත්විඳිය හැකි එය පිළිඹිබු කෙරෙන ආරක්ෂිත හා ශුද්ධ වූ ස්ථානයක් වට පත්වේවා.

මාගේ ප්‍රේමණීය දරුවෙනි, අප නව ජනවන්දනා වර්ෂය සඳහා සූදානම් වන මෙම අවස්ථාවේදී ඔබ සෑම කෙනෙකුවම මාගේ යාච්ඥාවලට ඇතුළත් කර ගනිමි. දෙවියන් වහන්සේගේ සිංහාසනය ඉදිරියේ පවත්වන ඔබගේ යාච්ඥාවලදී, දුර්වල හා පව්කාර වූ මෙම සේවකයාවද සිහිපත් කරන්න. ශුද්ධ වූ ත්‍රිත්වය වන; පියාණන් වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ සහ ශුද්ධාත්මයාණන් වහනසේ අපට පිරිසිදු හදවතක් ද, සේවය කිරීමට සූදානම් දෑත් ද ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමය විශ්වාසවන්තකම පිළිබිඹු කරන ජීවිතයක් ද ලබා දෙන සේක්වා. එමෙන්ම ශුද්ධ වූ තිඔටොකෝස්ගේ සහ සියලුම ශාන්තුවරයන්ගේ මැදිහත්වීම තුළින් දැනුත් සෑම වේලෙහිදීත් අපට ආරක්ෂාව ලැබේවා - ආමෙන්. ✝

පිතෘ ප්‍රේමය සහ යාච්ඥාව සමගින්,

✝මෝරන් මෝර් සාමුවෙල්
තියෝපිලස් මෙට්‍රොපොලිටන්

දිනය :

2026 සැප්තැම්බර් මස 10
වෙනි දින

ස්ථානය:
ලෝක සභා මූලස්ථානය.

---

**සැ.යු: කරුණාකර මෙම ලිපිය සියලුම ප්‍රාදේශීය භාෂාවන්ට පරිවර්තනය කර, විශ්වාසිකයින් දිරිගැන්වීම සඳහා සියලුම දේවස්ථාන වල කියවීමට කටයුතු කරන්න.**